# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date: 2025.06.30 පැය 0830 | දුරකථන අංකය Tel.NO: 011-2887973 | මගේ අංකය My NO: D/Media/Out/1309/2025 | විද්‍යුත් ලිපිනය E-Mails: dir.media@police.gov.lk |


## පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීමක් සම්බන්ධ තොරතුරු

**01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා දකුණු පළාත් විශේෂ මෙහෙයුම් ඒකකය.**

2025.06.30 වන දින අළුයම් කාලයේ රත්ගම පොලිස් වසමේ පන්විල ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා දකුණු පළාත් විශේෂ මෙහෙයුම් ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 100 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන රත්ගම පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 43 ක් වන පන්විල, රත්ගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

රත්ගම පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**02. හැෂ් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකය.**

2025.06.29 වන දින රාත්‍රී සපුගස්කන්ද පොලිස් වසම්මේ පමුණුවිල ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරුක් මත වැටලීමක් සිදු කර **හැෂ් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 208 ක් සමඟ සැකකරුවෙකු ද** අත්අඩංගුවට ගෙන සපුගස්කන්ද පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 23 ක් වන පමුණුවිල, ගෝනවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සපුගස්කන්ද පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**03. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා දඹුල්ල කඳවුර.**

2025.06.29 වන දින රාත්‍රී කාලයේ දඹුල්ල පොලිස් වසමේ පන්නම්පිටිය ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා දඹුල්ල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් ලීටර් 22 ක්, තඹ දඟරයක් හා යකඩ බැරල් 01 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන දඹුල්ල පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 29 ක් වන කිරලැස්ස, ලේනදොර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

දඹුල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්‍ය බලකා ඇටම්පිටිය උප කඳවුර.**

2025.06.29 වන දින උදෑසන කාලයේ ඇටම්පිටිය පොලිස් වසමේ යහලකඳුර ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්‍ය බලකා ඇටම්පිටිය උප කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් හා ඇටම්පිටිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් ඒකාබද්ධව ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් පෙරීමට යොදා ගන්නා ලද ගෝඩා ලීටර් 51 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇටම්පිටිය පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 39 ක් වන පහමුණතොට, ඇටම්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ඇටම්පිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්‍ය බලකා ලාහුගල කඳවුර.**

2025.06.30 වන දින අළුයම් කාලයේ පොතුවිල් පොලිස් වසමේ ලාහුගල වනෝද්‍යානයේ බෝගමුයාය ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්‍ය බලකා ලාහුගල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් **සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන ලාහුගල වනෝද්‍යාන භාරකරු වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 39 ක් වන සින්න පුදුකුඩිඉරිප්පු, පොතුවිල් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**